**<u>ග්‍රාම නිලධාරී සේවාවේ ගැටළු සඳහා විසඳුම්</u>**

අභ්‍යන්තර කටයුතු ස්වදේශ  කටයුතු පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2019-02-28 දින ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති සමග ඔවුන්ගේ සේවාවේ වර්තමානයේදී පැන නැගී ඇති ගැටළු සම්බන්ධව සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදී ඔවුන්ගේ ප්‍රධානතම ඉල්ලීම වන ග්‍රාම නිලධාරී ව්‍යවස්ථාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා එළඹෙන සතිය තුල ඉදිරිපත් කිරීමට එකඟතාව පලකරන ලදි.

ජාතික හැඳුනුම්පත් සැකසීම වෙනුවෙන් දීමනාවක් ලබා දීම සඳහා සියළුම ආයතන එකඟතාව පලකර ඇති බව එහිදී දැනුම් දෙන ලදි. එමෙන්ම සන්නිවේදන දීමනාව ලබා දීම සඳහා වන ඉල්ලීම මේ වන විටත් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව සඳහන් කරන ලදි. සාම නිලධාරියකු ලෙස ග්‍රාම නිලධාරීන්ට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම ප්‍රයෝගික තත්ත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බවද වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

සාම නිලධාරීන් ලෙස කටයුතු කරන, පොලිස් බලතල තම වසම තුල ක්‍රියාත්මක කරන නිලධාරීන් බැවින් වර්ජන සඳහා යොමු වීමට අවකාශ නොමැති බවද,  එසේ වැඩ වර්ජනයක් සිදු කරන්නේ නම් ග්‍රාම නිලධාරීන් ගෙන් සිදුවන අත්‍යාවශ්‍ය සේවාවන් සපයා දීම සඳහා වෙනත් විකල්ප ක්‍රියා මාර්ගයකට යොමු වීමට සිදු වන බවද ගරුඅමාත්‍යවරයා වැඩි දුරටත් පැවසීය.

මෙම සාකච්ඡාව සඳහා ගරු අමාත්‍යතුමා අමාත්‍යාංශයේ ලේකම් තුමා ජේෂ්ඨ නිළධාරීන් සහ  සියළුම වෘත්තීය සමිති නියෝජනය කරමින් නියෝජිතයන් සහභාගී විය. ඉතාම සුහදශීලි අයුරින් පැවති සාකච්ඡාවේදී සිය ඉල්ලීම් වලට අදාලව කාල වකවානු සහිතව ලබා දුන් එකඟතාවයන් සම්බන්ධව සියළුම සංගම් වල ප්‍රසාදය පල කරන ලදී.